බස්නාහිර පළාතේ ආණ්ඩුකාර ලේකම් කාර්යාලය
மேல் மாகாண ஆளுநர் பணிமனை

**SECRETARIAT OF THE GOVERNOR - WESTERN PROVINCE**

*" ජනතා හිතවාදී විශිෂ්ටතම පළාත් රාජ්‍ය සේවාවක් "*

ඔබේ අංකය. / உமது இல. / Your Ref. 1/4/2/5/134

මගේ අංකය / எனது இல. / My Ref. 1/4/4/295

දිනය / திகதி / Date 2015.12. 10

ප්‍රධාන ලේකම් කාර්යාලය 25 10 DEC 2015 PT. බස්නාහිර පළාත් සභාව

10 DEC 2015

ලේකම්,
පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව (බ.ප.),
109,
මහවීදිය,
බත්තරමුල්ල.

<u>බස්නාහිර පළාත් රාජ්‍ය සේවයේ පළාත් පාලන දෙපාර්තමේන්තුවේ ජ්‍යෙෂ්ඨ විමර්ශන නිලධාරී තනතුර සඳහා වන බඳවා ගැනීමේ පරිපාටිය</u>

උක්ත මැයෙන් යුතු ඔබේ සමාංක හා 2015.10.21 දිනැති ලිපිය හා බැඳේ.

02) ඒ අනුව බස්නාහිර පළාත් රාජ්‍ය සේවයේ පළාත් පාලන දෙපාර්තමේන්තුවේ ජ්‍යෙෂ්ඨ විමර්ශන නිලධාරී තනතුර සඳහා වන බඳවා ගැනීමේ පරිපාටිය 2015.12.03 දාතමින් ගරු ආණ්ඩුකාරතුමා විසින් අනුමත කර ඇති බව කාරුණිකව දන්වමි.

03) අනුමත කරන ලද අදාල බඳවා ගැනීමේ පරිපාටියේ පිටපතක් මේ සමග ඔබ වෙත එවමි.

අ/කලේ - පී.සෝමසිරි,
බ.ප .ආණ්ඩුකාර ලේකම් (වැ.බ).

ඊ.ඒ.අනුෂා කුමාරි,
සහකාර ලේකම්.

පිටපත : ප්‍රධාන ලේකම් (බ.ප) - අනුමත කරන ලද යථෝක්ත බඳවා ගැනීමේ පරිපාටියේ පිටපත් 02ක් මේ සමග ඔබ වෙත එවමි.


• පිළිතුරු සැපයීමේදී යොමු අංකය හා දිනය යෙදීමට කාරුණික වන්න. / பதில் அனுப்பும் போது தயவுசெய்து இலக்கத்தையும், திகதியையும் குறிப்பிடவும் / Please indicate my reference in the reply

| ලිපිනය / முகவரி Address | 109,. 5 වන මහල, රොටුන්ඩා ගොඩනැගිල්ල, ගාලු පාර, කොළඹ 03.<br>109, 5ம் மாடி, ரொட்டுண்டா கோபுரம், காலி வீதி, கொழும்பு - 03<br>109, 5th Floor, Rotunda Tower, Galle Road, Colombo 03 | | | |
|---|---|---|---|---|
| | ආණ්ඩුකාර ලේකම් / ஆளுநரின் செயலாளர் Secretary to the Governor | සහකාර ලේකම් / உதவிச் செயலாளர் / Assistant Secretary | පරිපාලන නිලධාරී / நிர்வாக அதிகாரி / Administartive Officer | කාර්යාලය / அலுவலகம் / Office |
| දුරකථන / தொலைபேசி / Telephone | 0112334097 | 0112334737 | 011 3159587 | 0112334347 / 0112334348 |
| ෆැක්ස් / பெக்ஸ் / Fax | 0112334098 | 0112334738 | | |
| විද්‍යුත් තැපැල / மின்னஞ்சல் / E-mail | secretary@governor.wp.gov.lk | as@governor.wp.gov.lk | ao@governor.wp.gov.lk | cma@governor.wp.gov.lk<br>info@govsec.wpc.gov.lk |

<u>බස්නාහිර පළාත් සහා රාජ්‍ය සේවයේ පළාත් පාලන දෙපාර්තමේන්තුවේ</u>
<u>ජ්‍යෙෂ්ඨ විමර්ශන නිලධාරී තනතුර සඳහා වන</u>
<u>බඳවා ගැනීමේ පරිපාටිය.</u>

**1. සම්බන්ධ වන ආයතන**

1.1. දෙපාර්තමේන්තුව :- පළාත් පාලන දෙපාර්තමේන්තුව (බ.ප)
යොමු අංකය :- එල්ජීඩී/02/21/03/32
දිනය :- 2015.08.14

1.2. අමාත්‍යාංශය :- පළාත් පාලන අමාත්‍යාංශය (බ.ප)
යොමු අංකය :- සීඑම්/ඩබ්පී/ඊ15/5-1-22
දිනය :- 2015.08.31

1.3. කළමනාකරණ සේවා අධ්‍යක්ෂ ජනරාල් විසින් තනතුර අනුමත කිරීම :- යොමු අංකය :- ඩීඑම්එස්/ඩී/පොදු/11-2
දිනය :- 2012.12.19

1.4. ප්‍රධාන ලේකම්(බ.ප) නිර්දේශය :- යොමු අංකය :- CSO/PTR/15/3/23
දිනය :- 2015-09-28

1.5. වැටුප් කොමිෂන් සභාවේ නිර්දේශය :- යොමු අංකය :-
දිනය :-

1.6. බස්නාහිර පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නිර්දේශය :- යොමු අංකය :- 1/4/2/5/134
දිනය :- 2015.10.21

1.7. ගරු ආණ්ඩුකාරතුමාගේ අනුමැතිය :- යොමු අංකය :- 1/4/4/295
දිනය :- 2015.12.03

**2. පත් කිරීම් බලධාරියා** :- බස්නාහිර පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාව.
ක්‍රියාත්මකවන දිනය :- ගරු ආණ්ඩුකාරතුමා අනුමත කළ දින සිට ක්‍රියාත්මක වේ.

**3. සේවා ගණය පිළිබඳ විස්තර**

3.1. සේවා ගණය :- අධීක්ෂණ
3.2. ශ්‍රේණි :- විශේෂ ශ්‍රේණිය.
3.3. පැවරෙන කාර්ය භාරය පිළිබඳ පොදු නිර්වචනය. :- අනුමත තනතුරු සංඛ්‍යාව සීමා වන පරිදි අභ්‍යන්තර බඳවා ගැනීමේ ක්‍රියාවලියක් මගින් බඳවා ගනු ලබන , ජ්‍යෙෂ්ඨ විධායක හා විධායක නිලධාරීන්ගේ කාර්යභාරයට පරිපූරක / සුසාධ්‍යකාරක/ උපස්ථම්භක වන පරිදි එම නිලධාරීන්ගේ අධීක්ෂණයට යටත්ව තනතුරු විශේෂිත කොට පවරා දෙනු ලබන පරිපාලනමය /පිරිස් කළමනාකරණ කාර්යයන් පැවරෙන නිලධර ගණයකි.

3.4. කාර්යයන් පැවරීම :- පළාත් පාලන කොමසාරිස්ගේ උපදෙස් මත පළාත් පාලන සහකාර කොමසාරිස් විසින් සිදු කරනු ලබයි.

**4. තනතුරෙහි /තනතුරුවල ස්වභාවය :-** ස්ථිර, විශ්‍රාම වැටුප් සහිතය.

අනුමත කරමි / නොකරමි
3/12/15
දිනය
2015.11.
කේ.සී. ලෝගේස්වරන්
ආණ්ඩුකාරවර

## 5. වැටුප්

5.1. වැටුප් කේත අංකය :- රා.ප.ච 6/2006 IV අනුව MN 7 - 2006A

5.2. වැටුප් පරිමාණය :- 20,030 –11 x 365– 18 x 500 - 33,045/-

5.3. ශ්‍රේණි ක්‍රමයට අදාළ ආරම්භක වැටුප් පියවර :-

| ශ්‍රේණිය | ආරම්භක වැටුප් පියවර | ආරම්භක වැටුප් තලය(රු.) |
|---|---|---|
| විශේෂ | පියවර 01 | 20,030/- |

## 6. සේවා ගණයට අයත් තනතුර/තනතුරු :-

6.1. අනුමත තනතුරු නාම, අනුමත තනතුරු සංඛ්‍යාව හා ඒවාට පැවරෙන කාර්යයන් :-

| අනුමත තනතුරු නාම | තනතුර අනුමත ශ්‍රේණිය | අනුමත තනතුරු සංඛ්‍යාව | කාර්යයන් |
|---|---|---|---|
| ජ්‍යෙෂ්ඨ විමර්ශන නිලධාරී | විශේෂ | 03 | • දිස්ත්‍රික්කයේ පළාත් පාලන ආයතනවලට අනුයුක්තව සේවය කරන විමර්ශන නිලධාරීන්ගේ රාජකාරි කටයුතු අධීක්ෂණය.<br>• එම විමර්ශන නිලධාරීන්ගේ කාර්ය සාධන වාර්තා ඇගයීම හා නිරීක්ෂණ නිර්දේශ ඉදිරිපත් කිරීම.<br>• කාර්යාල පරීක්ෂණවලදී විමර්ශන නිලධාරීන්ට අවශ්‍ය උපදෙස් ලබාදීම, මගපෙන්වීම, ඔවුන් මෙහෙයවීම හා එම වාර්තා නිරීක්ෂණ නිර්දේශ සහිතව පළාත් පාලන සහකාර කොමසාරිස් වෙත ඉදිරිපත් කිරීම.<br>• පළාත් පාලන ආයතන නිලධාරීන් සම්බන්ධයෙන් මූලික විමර්ශන සිදු කෙරෙන අවස්ථාවලදී එම නිලධාරීන්ට අවශ්‍ය උපදෙස් ලබා දීම,මගපෙන්වීම හා මූලික විමර්ශන වාර්තා චෝදනා කෙටුම්පත් පරීක්ෂා කර බලා නිරවද්‍යතාවය තහවුරු කරගෙන නිර්දේශ සහිතව පළාත් පාලන සහකාර කොමසාරිස් වෙත ඉදිරිපත් කිරීම.<br>• පළාත් පාලන ආයතන සම්බන්ධයෙන් ලැබෙන පෙත්සම් හා පැමිණිලි ලිපි සම්බන්ධයෙන් අප්‍රමාදව විමර්ශන නිලධාරීන් යොදවා පරීක්ෂා කර නිරීක්ෂණ නිර්දේශ පළාත් පාලන සහකාර කොමසාරිස් වෙත ඉදිරිපත් කිරීම.<br>• පළාත් පාලන ආයතනවල ගිණුම් නිවැරදිව කලට වේලාවට ඉදිරිපත් කරන බවට අදාළ විමර්ශන නිලධාරීන්ලවා අධීක්ෂණය කරවීම.<br>• පළාත් පාලන ආයතනවල ආදායම් අයවීම හිඟ ආදායම් අයකිරීමට අවශ්‍ය පියවර ගැනීම හා ඒ සම්බන්ධයෙන් අවශ්‍ය නෛතික ක්‍රියාමාර්ග ගන්නා බවට විමර්ශන නිලධාරි මාර්ගයෙන් අධීක්ෂණය කිරීම.<br>• දේශීය ණය අරමුදලින් ණය ලබා ගැනීම,පළාත් පාලන අරමුදලින් වියදම් දැරීම,තනතුරු ඇති කිරීම,ඉඩම් අත්පත් කර ගැනීම ආදී කටයුතුවලට අදාළ විමර්ශන නිලධාරීන්ගෙන් ලබා ගන්නා නිවැරදි තොරතුරු මත පළාත් පාලන සහකාර කොමසාරිස් වෙත නිරීක්ෂණ නිර්දේශ ඉදිරිපත් කිරීම.<br>• පළාත් පාලන ආයතනවලට අදාළව ලැබෙන විගණන විමසුම් විගණන පරීක්ෂණ වාර්තා සම්බන්ධයෙන් නොපමාව පිළිතුරු යවන බවට විමර්ශන නිලධාරීන් මගින් අධීක්ෂණය කිරීම.<br>• පළාත් පාලන ආයතනවල පරිපාලන කටයුතුවලදී උපදේශක මට්ටමින් අවශ්‍ය නිවැරදි උපදෙස් විෂයපථයට ඇතුලත් නෛතික මූලාශ්‍ර අනුව ලබා දෙන බවට හා එම උපදෙස් පරිදි කටයුතු කරන බවට අධීක්ෂණය කිරීම හා අවශ්‍ය පරිදි පළාත් පාලන සහකාර කොමසාරිස් වෙත වාර්තා කිරීම. |



ගරු ආණ්ඩුකාරතුමා විසින් අනුමත කරන ලදී.
ලිපි අංකය : 1/4/4/295 දිනය : 2015.12.03

| | | | |
|---|---|---|---|
| | | | • පාර්ලිමේන්තු උපදේශක කාරක සභා,මහජන පෙත්සම් කාරක සභා,මානව හිමිකම් කොමිෂන් සභා, ආදි ආයතනවලට ලැබෙන පැමිණිලි පෙත්සම් සම්බන්ධයෙන් අවශ්‍ය වාර්තා නියමිත වේලාවට නිරීක්ෂණ නිර්දේශ සහිතව ඉදිරිපත් කරන බවට වග බලා ගැනීම හා අවශ්‍ය පරිදි එම කොමිෂන් සභා සඳහා සහභාගිවීම.<br>• පළාත් පාලන කොමසාරිස් හෝ ඊට ඉහළ නිලධාරියෙකු විනය බලධාරියා වන චූදිතයන් සම්බන්ධයෙන් වූ විනය පරීක්ෂණවලදී පැමිණිල්ල මෙහෙයවීම සඳහා සුදුසු නිලධාරියෙකු යොමු කිරීම හා ඔහුට අවශ්‍ය උපදෙස් ලබා දීම. |

6.2. ඒකාබද්ධ නිලධර සංඛ්‍යාව :- 03යි.

7. බඳවා ගැනීමේ ක්‍රමය

7.1. බඳවා ගන්නා ප්‍රතිශතයන් :-

| ධාරාව | ප්‍රතිශතය |
|---|---|
| විවෘත | අදාළ නැත. |
| සීමිත | 100% |
| කුසලතා | අදාළ නැත. |

7.2. විවෘත බඳවා ගනීම :- අදාළ නැත.

7.3. සීමිත බඳවා ගැනීම

7.3.1. බඳවා ගන්නා ශ්‍රේණිය :- විශේෂ ශ්‍රේණිය.

7.3.2. සුදුසුකම්

7.3.2.1. අධ්‍යාපන සුදුසුකම් :- අදාළ නැත.

7.3.2.2. වෘත්තීය සුදුසුකම් :- අදාළ නැත.

7.3.2.3. පළපුරුද්ද :- විමර්ශන නිලධාරි I ශ්‍රේණියේ වසර 05 ක සක්‍රීය හා සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.

7.3.2.4. කායික සුදුසුකම් :- තනතුරේ රාජකාරී ඉටු කිරීමට ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවයෙන් යුක්ත වීම.

7.3.2.5. වෙනත් :-

i. ශ්‍රී ලංකාවේ පුරවැසියෙකු වීම.
ii. යහපත් චරිතයකින් යුක්ත වීම.
iii. තනතුරට බඳවා ගැනීම සඳහා අවශ්‍ය සියලු සුදුසුකම් අයදුම්පත් කැඳවීමේ නිවේදනයේ/ගැසට් පත්‍රයේ සඳහන් කරනු ලබන දිනට සෑම ආකාරයකින්ම සම්පූර්ණ කර තිබිය යුතුය.

7.3.3. වයස

7.3.3.1. අවම සීමාව :-
7.3.3.2 උපරිම සීමාව :-

දැනට සේවයේ නියුතු I ශ්‍රේණියේ විමර්ශන නිලධාරීන් ගෙන් බඳවා ගන්නා බැවින් වයස් සීමාව අදාළ නොවේ.

ගරු ආණ්ඩුකාරතුමා විසින් අනුමත කරන ලදී.
ගොනු අංකය : 1/4/4/295 දිනය : 2015.12.02

7.3.4 බඳවා ගැනීමේ ක්‍රමය

7.3.4.1 ලිඛිත විභාගය

| විෂයන් | උපරිම ලකුණු ප්‍රමාණය | සමත් ලකුණු ප්‍රමාණය |
|---|---|---|
| ගිණුම් හා පළාත් මූල්‍ය රීති | 100 | 40 |
| ආයතන කාර්ය පරිපාටිය හා පළාත් පාලන ආයතනවලට අදාළ මූලික අණපනත් හා අනුශාංගික නීති. | 100 | 40 |
| සිද්ධි අධ්‍යයනය | 100 | 40 |

සටහන :- මෙම පරිපාටියට අනුව පළමුවරට බඳවා ගැනීමේදී පමණක් විමර්ශන නිලධාරි තනතුරේ වසර පහළොවක (15) සක්‍රිය හා සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර ඇති විමර්ශන නිලධාරීන්ටද ලිඛිත විභාගයට පෙනී සිටීමට අවකාශය ඇත.තවද, ලිඛිත පරීක්ෂණයේදී විභාගය සමත් අපේක්ෂකයින් විසින් ලකුණු ලබාගැනීමේ අනුපිළිවෙල අනුව පවත්නා පුරප්පාඩු සඳහා තෝරා ගනු ලැබේ.

7.3.4.1.1 පවත්වන බලධරයා :- බස්නාහිර පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාව හෝ ඔවුන් විසින් බලය පවරනු ලබන ආයතනයක් මගින්.

(ලිඛිත පරීක්ෂණයේ විෂය නිර්දේශය - ඇමුණුම අංක 01.)

7.3.4.2 වෘත්තීය පරීක්ෂණය :- අදාළ නැත.

7.3.4.2.1. පවත්වන බලධරයා :- අදාළ නැත.

7.3.4.3 සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණය

ඉටුකර ගැනීමට අපේක්ෂිත අරමුණු :- ලකුණු ලබාදෙනු නොලැබේ.සුදුසුකම් පරීක්ෂා කිරීම සඳහා පමණක් පවත්වනු ලැබේ.

7.3.4.3.1 සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය පත්කරන බලධරයා :- බස්නාහිර පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාව

7.3.4.4 ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය :- අදාළ නැත.

7.3.4.4.1 ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය පත්කරන බලධරයා :- අදාළ නැත.

7.3.5 අයදුම්පත් කැඳවීමේ ක්‍රමය :- අභ්‍යන්තර නිවේදනයක් මගින් අයදුම්පත් කැඳවනු ලැබේ.

7.4 කුසලතා පදනම මත බඳවා ගැනීම :- අදාළ නැත.

**8** **කාර්යක්ෂමතා කඩඉම** :- අදාළ නැත.



ගරු ආණ්ඩුකාරතුමා විසින් අනුමත කරන ලදී
ගොනු අංකය : 1/4/4/295 දිනය : 2015.12.03

9 **භාෂා ප්‍රවීණතාවය** :-

9.1

| භාෂාව | ලබාගත යුතු ප්‍රවීණතාවය |
|---|---|
| 1. රාජ්‍ය භාෂාව | අදාළ නැත. |
| 2. අනෙක් රාජ්‍ය භාෂාව | රා.ප.ච.01/2014 චක්‍රලේඛයේ විධිවිධානයන්ට අනුව අදාළ මට්ටමේ ප්‍රවීණතාවය ලබා ගත යුතුය. |
| 3. සන්ධාන භාෂාව (අදාළ වන්නේ නම් පමණි) | අදාළ නැත. |

10 **ශ්‍රේණි උසස් කිරීම** :- අදාළ නැත.

11 **තනතුරුවලට පත් කිරීම** :- අදාළ නැත.

12 **බස්නාහිර පළාත් සභා රාජ්‍ය සේවා කාර්ය පරිපාටික රීති සංග්‍රහයේ දැක්වෙන පොදු කොන්දේසි වලට පරිබාහිර වන්නාවූ කොන්දේසි** :-

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයේ විධිවිධානවලට ද, බස්නාහිර පළාත් සභා මූල්‍ය රීති සංග්‍රහයට ද, කලින් කල බස්නාහිර පළාත් සභාවේ ගරු ආණ්ඩුකාරතුමා විසින් පනවනු ලබන රෙගුලාසි නොහොත් නියෝගවලට ද, බස්නාහිර පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් කලින් කල පනවනු ලබන රෙගුලාසි නොහොත් නියෝගවලට ද, අමාත්‍යාංශය හා දෙපාර්තමේන්තු නියෝගවලට ද ආයතන ප්‍රධානියා විසින් නිකුත් කරනු ලබන නියෝගවලට ද අනුව කටයුතු කළ යුතුය.

13 **බස්නාහිර පළාත් සභා රාජ්‍ය සේවා කාර්ය පරිපාටික රීති සංග්‍රහයේ දැක්වෙන අර්ථ නිරූපණවලට පරිබාහිර වන්නාවූ අර්ථ නිරූපණ** :-

බස්නාහිර පළාත් සභා රාජ්‍ය සේවා කාර්ය පටිපාටික රීතිවල දැක්වෙන අර්ථ නිරූපණවලට පරිබාහිර වන්නා වූ අර්ථ නිරූපණ කිසිවක් වේනොත් ඒ සම්බන්ධයෙන් බස්නාහිර පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව / බස්නාහිර පළාත් ගරු ආණ්ඩුකාරතුමා විමසා කටයුතු කරනු ඇත.

14 **ශ්‍රේණි ක්‍රමයට අන්තර්ග්‍රහණය** :- අදාළ නැත.

15 මෙම පරිපාටියේ විධිවිධාන සලසා ඇති කරුණු සම්බන්ධව ගැටළු පැනනගින අවස්ථාවකදී හා/හෝ මෙම පරිපාටියේ විධිවිධාන සලසා නොමැති කරුණු සම්බන්ධයෙන් බස්නාහිර පළාත් ගරු ආණ්ඩුකාරතුමා විමසා තීරණය කරනු ඇත.

ගරු ආණ්ඩුකාරතුමා විසින් අනුමත කරන ලදී
ගොනු අංකය : 1/4/4/295 දිනය : 2015.12.03

## 16. අර්ථ නිරූපණ :-

<u>සතුටුදායක සේවා කාලය:</u>

(i) පළාත් සභා රාජ්‍ය සේවයේ නිලධාරියෙකු විසින් කාර්යක්ෂමව හා අනලස්ව රාජකාරි ඉටු කිරීම මඟින්ද,සමත් විය යුතුව තිබූ කාර්යක්ෂමතා කඩඉම් සමත්වීම මඟින්ද, සිදු කළ යුතුව තිබූ පත්වීම් ස්ථිර කිරීම සඳහා අවශ්‍ය සුදුසුකම් සම්පූර්ණ කිරීම මඟින්ද,එම කාලය තුළ දී උපයාගත යුතුව තිබූ සියලුම වැටුප් වර්ධක උපයාගෙන ඇත්තා වූ සහ ඔහු විසින් දඬුවම් ලැබිය යුතු වරදක් සිදු නොකරන ලද්දා වූ කාලසීමාවක් වන්නේය.

(ii) නිලධාරියා වෙත ලබා දිය යුතුව තිබූ වාර්ෂික වැටුප් වර්ධක නීත්‍යානුකූල හේතු මත අත්හිටුවා,අඩු කොට, නතර කොට හෝ විලම්භනය කොට ඇති කාල පරිච්ඡේදයක් වේ නම් එයද, ආයතන සංග්‍රහයේ ii වැනි කාණ්ඩයේ, වැරදි පිළිබඳ පළමු වැනි උපලේඛනය යටතේ දඬුවම් ලැබිය හැකි වරදක් සිදු කර ඇති විටක එම වරද සිදු කරනු ලැබූ දින සිට වසර 03 ක කාලයක් ද සහ ආයතන සංග්‍රහයේ ii වැනි කාණ්ඩයේ, වැරදි පිළිබඳ දෙවන උපලේඛනය යටතේ දඬුවම් ලැබිය හැකි වරදක් සිදු කර ඇති විටක එම වරද සිදු කරනු ලැබූ දින සිට එක් වසරක කාලයක් ද සතුටුදායක සේවා කාලය ගණනය කිරීමේදී බැහැර කළ යුතු වන්නේය.

<u>සක්‍රීය සේවා කාලය:</u>

'සක්‍රීය සේවා කාලය' යනු ස්වකීය තනතුරට අදාළ වැටුප් ලබමින් සත්‍ය වශයෙන්ම රාජකාරියෙහි යෙදී සිටි සේවා කාලය වේ. රජයෙන් අනුමත ප්‍රසූත නිවාඩු හැර අනෙකුත් සියලුම වැටුප් රහිත නිවාඩු කාල පරිච්ඡේදයන් සක්‍රීය සේවා කාලය සඳහා ගණනය කරනු නොලබන්නේය.

| | | | |
|---|---|---|---|
| සකස් කළේ | : ............................ | පරීක්ෂා කළේ | : සෙව්වන්දි හෙට්ටිආරච්චි |
| නම | : ඩී. අයි. සිතුල්ගොඩ | නම | : පළාත් පාලන සහකාර කොමසාරිස් |
| තනතුර | : ............ සහකාර | තනතුර | : පළාත් පාලන සහකාර කොමසාරිස් කාර්යාලය |
| දිනය | : පළාත් පාලන දෙපාර්තමේන්තුව (බ.ප.) | දිනය | : කොළඹ දිස්ත්‍රික්කය |
| | 2015.08.13 | | 2015.08.14 |

නිර්දේශ කර ඉදිරිපත් කරමි.

අත්සන : ............................
(දෙපාර්තමේන්තු ප්‍රධානියා)

නම : චන්ද්‍රානි සමරකෝන්
තනතුර : පළාත් පාලන කොමසාරිස්
දිනය : බස්නාහිර පළාත

2015.08.14

ගරු ආණ්ඩුකාරතුමා විසින් අනුමත කරන ලද්
ගොනු අංකය : 1/4/4/295 දිනය : 2015.12.03

යොමු අංකය : CM/MP/E15/5/1-22

බස්නාහිර පළාත් සභා රාජ්‍ය සේවයේ පළාත් පාලන දෙපාර්තමේන්තුවෙහි ජ්‍යෙෂ්ඨ විමර්ශන නිලධාරී තනතුර සඳහා යෝජිත මෙම බඳවා ගැනීමේ පරිපාටිය අනුමත කිරීම නිර්දේශ කරමි.

අත්සන : ..........................
අමාත්‍යාංශ ලේකම් (බ.ප)

දිනය : 2015/08/31 නිල මුද්‍රාව:

එම්. ඒ. බී. දයා සෙනරත්
ලේකම්
අධ්‍යාපන, පළාත් පාලන, ඉඩම්, මිනිස්බල හා ... සහ ... අමාත්‍යාංශය (බ.ප.)

---

යොමු අංකය : CSO/PTR/15/3/23

බස්නාහිර පළාත් සභා රාජ්‍ය සේවයේපළාත් පාලන දෙපාර්තමේන්තුවෙහි ජ්‍යෙෂ්ඨ විමර්ශන නිලධාරී තනතුර සඳහා යෝජිත මෙම බඳවා ගැනීමේ පරිපාටිය අනුමත කිරීම නිර්දේශ කරමි.

අත්සන : ..........................
ප්‍රධාන ලේකම් (බ.ප)

දිනය : 2015 - 09 - 28 නිල මුද්‍රාව:

---

යොමු අංකය : 1/4/2/5/134

බස්නාහිර පළාත් සභා රාජ්‍ය සේවයේ පළාත් පාලන දෙපාර්තමේන්තුවෙහි ජ්‍යෙෂ්ඨ විමර්ශන නිලධාරී තනතුර සඳහා යෝජිත මෙම බඳවා ගැනීමේ පරිපාටිය අනුමත කිරීම නිර්දේශ කරමි.

අත්සන : ..........................
ලේකම්, පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව(බ.ප)

දිනය : 2015.10.21 නිල මුද්‍රාව:

ඩී. රාජපක්ෂ
ලේකම්
පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව
බස්නාහිර පළාත

---

යොමු අංකය : 1/4/4/295

බස්නාහිර පළාත් සභා රාජ්‍ය සේවයේ පළාත් පාලන දෙපාර්තමේන්තුවෙහි ජ්‍යෙෂ්ඨ විමර්ශන නිලධාරී තනතුර සඳහා වන බඳවා ගැනීමේ පරිපාටිය ...2015.12.03...දින ගරු ආණ්ඩුකාරතුමා විසින් අනුමත කරන ලදි.

අත්සන : ..........................
ආණ්ඩුකාර ලේකම් (බ.ප)

දිනය : 2015.12.03 නිල මුද්‍රාව:

සී. සෝමසිරි
බ.ප. ආණ්ඩුකාර ලේකම් (වැ.බ.)

---

ගරු ආණ්ඩුකාරතුමා විසින් අනුමත කරන ලදී
යොමු අංකය : 1/4/4/295. දිනය : 2015.12.03

ඇමුණුම 01.

**<u>බස්නාහිර පළාත් සහා රාජ්‍ය සේවයේ පළාත් පාලන දෙපාර්තමේන්තුවේ</u>**
**<u>ජ්‍යෙෂ්ඨ විමර්ශන නිලධාරී තනතුරට සීමිතව බඳවා ගැනීම සඳහා වන ලිඛිත පරීක්ෂණය.</u>**

1. විභාගයේ/ වෘත්තිය පරීක්ෂණයේ නම :- බස්නාහිර පළාත් සහා රාජ්‍ය සේවයේ පළාත් පාලන දෙපාර්තමේන්තුවේ ජ්‍යෙෂ්ඨ විමර්ශන නිලධාරී තනතුරට සීමිතව බඳවා ගැනීම සඳහා වන ලිඛිත පරීක්ෂණය.

2. විභාගය/ වෘත්තිය පරීක්ෂණය පිළිබඳ විස්තර :-

| විෂයයන් | කාලය | මුළු ලකුණු | සමත් ලකුණු |
|---|---|---|---|
| ගිණුම් හා පළාත් මූල්‍ය රීති | පැය 01 | 100 | 40 |
| ආයතන කාර්ය පරිපාටිය හා පළාත් පාලන ආයතන වලට අදාළ මූලික අණපනත් හා අනුශාංගික නීති. | පැය 01 | 100 | 40 |
| සිද්ධි අධ්‍යයනය | පැය 01 | 100 | 40 |

3. පවත්වනු ලබන බලධරයා :- බස්නාහිර පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාව හෝ එහි බලය පැවරෙන ආයතනයක්.

4. පවත්වනු ලබන්නේ කොපමණ කාලසීමාවකට වරක්ද යන වග :- ඇතිවන පුරප්පාඩු සංඛ්‍යාව සලකා බැලීමෙන් පසුව.

5. විභාග සඳහා වන විෂය නිර්දේශය:

| ප්‍රශ්න පත්‍රයේ නම | විෂය නිර්දේශය |
|---|---|
| ගිණුම් හා පළාත් මූල්‍ය රීති | • පළාත් පාලන ආයතනවලට අදාළ ගිණුම් තැබීම.<br>• අභ්‍යන්තර විගණනය.<br>• පළාත් මූල්‍ය රීති I ,II ,IV, V, VI, VII යන පරිච්ඡේදයන්<br>• පළාත් පාලන ආයතනයට අදාළ මූල්‍ය රීති හා ගිණුම් ක්‍රම.<br>• පළාත් පාලන ආයතනවලට අදාළව අයවැය ලේඛන පිළියෙල කිරීම.<br>• පළාත් පාලන ආයතනවල අවසාන ගිණුම් පිළියෙල කිරීම. |
| ආයතන කාර්ය පරිපාටිය හා පළාත් පාලන ආයතන වලට අදාළ මූලික අණපනත් හා අනුශාංගික නීති. | • බස්නාහිර පළාත් සභා රාජ්‍ය සේවා කාර්ය පටිපාපාටික රීති හා ආයතන සංග්‍රහයේ VII, VIII, IX, XII, XXI, XXXII පරිච්ඡේද හා ආයතන සංග්‍රහයේ II කාණ්ඩයේ XLVII, XLVIIIපරිච්ඡේද පිළිබඳ දැනුම.<br>• පළාත් පාලන ආයතනවලට සම්බන්ධ අණපනත් පිළිබඳ අවබෝධය විමසා බැලීම.<br>• ප්‍රාදේශීය සභා පනත, නගර සභා ආඥා පනත, මහා නගර සභා ආඥා පනත, පළාත් පාලන ආයතන සම්බන්ධව පනත් හා අනුශාංගික පනත්, සම්මත අතුරු ව්‍යවස්ථා.<br>• පැමිණිල්ල මෙහෙයවීම හා මූලික විමර්ශන පැවැත්වීම පිළිබඳව දැනුම.<br>• කාර්යාල පරීක්ෂණ පැවැත්වීම, ගැටළු හඳුනාගැනීම හා ඒ සඳහා අවශ්‍ය උපදෙස් ලබා දීම පිළිබඳ ඇති දැනුම.<br>• අතුරු ව්‍යවස්ථා සම්පාදනය. |
| සිද්ධි අධ්‍යයනය | පළාත් පාලන ආයතනයක් සම්බන්ධයෙන් වූ ගැටළුවක් සම්බන්ධයෙන් කළමනාකරණ විසඳුමක් ලබා දීම හෝ නිලධාරියෙකු හෝ කණ්ඩායමක් විසින් සිදු කරන විනය විරෝධී ක්‍රියාවක් සම්බන්ධයෙන් විනය බලධාරියෙකු විසින් ක්‍රියා කරනු ලබන ආකාරය පිළිබඳව දැනුම පරීක්ෂා කිරීම සඳහා දෙනු ලබන ඡේදයක් ආශ්‍රයෙන් අසනු ලබන ප්‍රශ්නාවලියකට පිළිතුරු සැපයීම. |

අත්සන : ............................

(දෙපාර්තමේන්තු ප්‍රධානියා)

නම : චන්ද්‍රානී සමරකෝන්
තනතුර : පළාත් පාලන කොමසාරිස් බස්නාහිර පළාත.
දිනය : 2015.08.14



ගරු ආණ්ඩුකාරතුමා විසින් අනුමත කරන ලදී.
ගොනු අංකය : 1/4/4/295 දිනය : 2015.12.03